# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

42 වන කාණ්ඩය | 03 වන කලාපය | 2026 මාර්තු කලාපය

# අයිතිවාසිකම්, සමානාත්මතාවය හා සවිබල ගැන්වීම වෙනුවෙන් කාන්තාවෝ පෙළ ගැසෙති.




මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම නිමිතිකොට ගෙන කටුනායක, බියගම, කොග්ගල, වතුපිටිවල, කාන්තාවන් වීදි බසිමින් සිය අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා අදාළ පාර්ශවයන්වල වගවීම අවධානයට ලක් කෙරුණි.

ප්‍රචණ්ඩත්වයට හා හිංසනයට, ජීවත් වීමට සරිලන වැටුප්, සුරැකුම් ආර්ථිකයේ වැඩ, ඉඩම් හා නිවාස අයිතිය, භාෂා අයිතිය හා ලිංගික අනන්‍යතාවයන්ට ගරු කරන සමාජ ක්‍රමයක් ඇතිකර ගැනීම වෙනුවෙන් එදින මොවුන් පෙළ ගැසුණි.

වර්තමාන සමාජය තුළ ඇඟළුම් කම්කරුවන් මුහුණ පා සිටින රැකියා අනාරක්ෂිතභාවය, සමාජ සංරක්ෂණය වන ශ්‍රම වෙළඳපල තුළ ස්ත්‍රී දායකත්වය අඩුවෙමින් පවතින තත්ත්වයක් තුළ ඒ වෙනුවෙන් වන ප්‍රතිපත්ති සම්පාදනයේ දී වැඩ පරිසරය තුළ සිදුවන ගැටලු අවම කරගැනීමට මෙහි දී මූලික අරමුණ වූ අතර ඩාබිඳු සාමූහික සංගමය, ස්ටෑන්ඩ් අප් මූව්මන්ට්, TGCWU, ශ්‍රමාභිමානී කේන්ද්‍රය, RED, We Women Lanka සංවිධාන මේ උද්ඝෝෂණය සාර්ථක කර ගැනීම උදෙසා සක්‍රීය දායකත්වය සපයන ලදී.

2 වන පිටුවට...

## ඇතුළු පිටු

03 පිටුව - ජාත්‍යන්තර කාන්තා දින ප්‍රකාශනය
04-07 පිටු - අපේ වැඩ
08 පිටුව - ඇඟළුම් කම්හල් වසා දැමීම සාධාරණද?
09 පිටුව - වැඩ කරන කාන්තාවන් සඳහා සමාජ ආරක්ෂාව සහ යුක්තිය සහතික කිරීම
10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේලිකාව
11 පිටුව - කවි පිටුව/කම්කරු නීති ප්‍රතිසංස්කරණය

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective

# සමානාත්මතාවයට, ගරුත්වයට හා යුක්තියට ඇති බාධා ඉවත් කරමු.

115 වැනි ජාත්‍යන්තර කාන්තා දිනය පසුගිය 8 වන දා ගෝලීය වශයෙන් කාන්තාවන් මුහුණ දෙන අභියෝග මතු කරමින් සමරන්නට යෙදුණි. මෙවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තේමාවන් ලෙස යුක්තිය නම් කර තිබුනත් ඒවා අභියෝගයට ලක්වන තරමට වැඩ කරන පංතියේ කාන්තාවන් නීතිය ඉදිරියේ සාධාරණ යුක්ති සහගත හඬක් නැගීමට අවදානම් ලං කරගෙන සිටී. රැකියාවේ අනාරක්ෂිත බව, ප්‍රචණ්ඩත්වය, හිංසනය පිළිබඳ සමීක්ෂණ වාර්තා වලින් 78% ක ප්‍රමාණයක් සිදුවීම් පැමිණිලි නොකරන බවට වාර්තා කරයි. සමානාත්මතාවය, ගරුත්වය, යුක්තියට ලංවීමට බාධාවන් ඇති බව මෙයින් පිළිබිඹු වේ. වැඩ ලෝකය තුළ සිදුවන හිංසනයන් හා ප්‍රචණ්ඩත්වයට පිටු දැකීම සඳහා වූ C190 සම්මුතිය 2026 ජනවාරි 6 දා රජය විසින් අපරාණුමත කරන ලදී. නමුත් ඒවා පාර්ලිමේන්තු පනතක් ලෙස ගෙනෙන තෙක් එහි සැබෑ ප්‍රතිඵල කම්කරුවන්ට භුක්ති විඳිය නොහැක. ඒනිසාම කම්කරු නීති ප්‍රතිසංශෝධනයට ලක්ව ඇති මේ මොහොතේ ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට බලධාරීන් කටයුතු කළ යුතුව ඇත. එසේම කාන්තා ශ්‍රම බලකාය පැවති ප්‍රමාණයටත් වඩා පහත වැටී ඇති නිසා කාන්තාවන්ට ස්ථිර රැකියා කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට ද ඒ අනුව දිවා සුරකුම් මධ්‍යස්ථාන, ඇති කිරීමට වග බලා ගත යුතු අතර සුරකුම් ආර්ථිකයේ වැඩ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමටද, ආරක්ෂිත ප්‍රවාහන පද්ධතියක් මෙන්ම සමාජභාවීය පදනම් මත ප්‍රතිපත්ති සකස් කිරීම ද මේ මොහොතේ අවධානය යොමු කළ යුතුය.

වර්තමානයේ ඇඟළුම් ක්ෂේත්‍රයේ ප්‍රධාන පෙළේ කර්මාන්තශාලා වසා දැමීමට කටයුතු කිරීම, "ඔටෝ මේෂන්" වැනි තාක්ෂණය භාවිත කිරීම නිසා රැකියා කප්පාදුව, ගෝලීය වශයෙන් වන බලපෑම් වල සියලු බර කම්කරුවන්ට දරා ගන්නට සැලැස්වීම, ස්වභාවික විපත් නිසා වන හානි වලදී රාජ්‍ය මැදිහත් වීම් අවම වීම වැනි කාරණා මෑතක දී කම්කරුවන්ගේ ජීවිත වලට තදින්ම බලපෑම් කරන ලදී. මේ නිසා ක්ෂේත්‍ර මට්ටමේ වූ වැටුපක් පිළිබඳ අවධානය යොමු කිරීම ද වැටුප ගෝලීය සැපයුම් ජාලයේ කොටසක් බවද අවබෝධ කරගනිමින් නව අභියෝග ඔස්සේ පර්යේෂණ කරමින් ආරක්ෂිත පරිසරයක් තුළ සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් මෙන්ම සෞඛ්‍ය සම්පන්න සේවා කාලයක් වෙනුවෙන් අවධානය යොමු කිරීම ගුණාත්මක ජීවිතයකට හා ගෞරවනීය රැකියාවකට හා කර්මාන්තයේ චිරස්ථායී බව රඳා පවත්වා ගැනීමට ඉවහල් වේ.

1 පිටුවෙන්... **අයිතිවාසිකම්,**




"අයිතිවාසිකම්, ගෞරවය සහ සමානාත්මතාවය" යන මැයෙන් අත් පත්‍රිකාවක් මුද්‍රණයකොට බෙදා හැරීමද, සමාජ මාධ්‍ය ඔස්සේ ඊට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීමද, මීට සමගාමීව සිදු කරන ලදී.

එසේම වර්තමානයේ රැකියා අවධානම පිළිබඳව හදිසියේම කර්මාන්තශාලා වසා දැමීම සම්බන්ධවද, පාරිසරික ගැටළු සම්බන්ධවද තව දුරටත් අවධානය යොමු කරමින් දිනෙන් දින රැකියා පරිසරය තුළ විඳින්නට සිදුවන ගැටලු වලට සාමූහික ලෙස මුහුණ දීම් අවශ්‍යතාව හඳුනා ගනිමින් අනෙකුත් සංවිධාන හා ඒකාබද්ධව සමරනු ලැබූ ජාත්‍යන්තර කාන්තා දිනය සාර්ථකව නිමා කර ගැනීමට හැකි විය.





# ජාත්‍යන්තර කාන්තා දින ප්‍රකාශනය

"සෑම ගැහැණු ළමයෙකුටම යුක්තිය සාධාරණත්වය සහ ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම" යන ජාත්‍යන්තර තේමාව යටතේ මෙවරත් 2026 ජාත්‍යන්තර කාන්තා දිනය ඩාබිඳු අප සමරන්නේ අභිමානයෙනි.

මෙම තේමාව හුදෙක් පාඨයක් පමණක් නොව එයින් පිළිබිඹු කරන්නේ ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමේ සැඟවුණු මෙහෙවර ඉටුකරන සුවහසක් ඇඟළුම් කම්කරු කාන්තාවන්ගේ යථාර්ථය ඉස්මතු කිරීමේ අවස්ථාවක් ලෙසයි.

තම ආර්ථික අපහසුතා වලට විසඳුමක් ලෙස රැකියාවක් සොයමින් නොදන්නා නගරයක වෙළඳ කලාපවලට සංක්‍රමණය වන කාන්තාව කුඩා බෝඩිං කාමරයක සිරවී තම ශක්තිය දියකර හරින්නේ ඇය වෙනුවෙන් පමණක්ම නොවේ. මවක්, දියණියක්, බිරිඳක්, සහෝදරියක් ලෙස වැටුප් නොලබන සුරැකුම් වැඩ සහ යුතුකම් ඉටු කිරීමේ අරමුණ ඇතිවය. හැඟීම්, ආර්ථික බර, ඉහළ යන ජීවන බර, හිංසන, අනාරක්ෂිත පරිසරය, සමාජ අභියෝග, වැනි අභියෝග හමුවේ ශක්තිමත්ව සිටීමට උත්සාහ දරන ඇයගේ අයිතිවාසිකම් සුරැකීම අප සැමගේ වගකීමක් නොවේද.

ජාත්‍යන්තර කාන්තා දිනය හුදෙක් සැමරීමක් පමණක් නොව ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය සිහි කැඳවීමකි.

**මෙම වසරේ ඩාබිඳු අප ඇඟළුම් කම්කරු සේවිකාවන් සමඟ එක්ව ප්‍රකාශ කරන ඉල්ලීම් ලෙස,**

- වැඩ ලෝකයේ සේවක හිංසනය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංගමයේ 190 සම්මුතිය (C190) පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සම්මත වීම සහ ශක්තිමත්ව බලාත්මක විය යුතුය.
- රාත්‍රී සේවා මුර සඳහා අත්‍යාවශ්‍ය ආරක්ෂිත සේවා පරිසරයත්, ආරක්ෂක ප්‍රවාහන පහසුකම්, විවේක ස්ථාන, හොඳ ආලෝකයක් මෙන්ම සනීපාරක්ෂක පහසුකම් ලබා දිය යුතුය.
- ආරක්ෂිත සහ සාධාරණ ගෙවීමක් සහිත නවාතැන් ළඟා වීමට පහසු අත්‍යවශ්‍ය සේවා වැනි තාවකාලික පදිංචිකරුවන්ගේ මූලික අයිතීන් ගෞරවය තහවුරු කළ යුතුය.
- සියලුම සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කළ යුතුය. අත්තනෝමතික ලෙස කර්මාන්තශාලා වසා දැමීම සහ සේවයෙන් පහ කිරීම නැවැත්විය යුතුය.
- වසංගත රෝග, ආර්ථික අර්බුද, ස්වභාවික විපත් වැනි අනතුරු කාලවල සේවකයින් ආරක්ෂා කරන සමාජ ආරක්ෂක ක්‍රමවේද හඳුන්වාදිය යුතුයි.
- කාන්තාවන්ගේ සුරැකුම් වැඩවලට වටිනාකමක් ලබා දෙමින් සුරැකුම් වැඩ ශ්‍රමයක් ලෙස පිළිගත යුතුය.
- සේවකයන්ගේ සෞඛ්‍ය සහ ප්‍රජාව ආරක්ෂා කරන පරිසරය යුක්තියට අනුකූලතාවයක් ලබාදිය යුතුයි.
- කම්කරු නීති ප්‍රතිශංසෝධනය මගින් කාන්තාවන්ට ගෞරවය සාධාරණත්වය සහ අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය.
- කාන්තාවන්ට ශ්‍රම බලකායට දායක විය හැකි නීති රීති සම්පාදනය කළ යුතුය.
- දින පහේ වැඩ සතිය අහෝසි කළ යුතුය.
- වැටුප් කප්පාදුව නොකරමින් ඔසප් දින නිවාඩුව ලබාදිය යුතුය. ඔසප් දිනවලදී සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතුය.
- ආයතන කළමණාකාරීත්වයේ පාලනය සහිත සේවක සභාව වෙනුවට කම්කරු නායකත්වයෙන් යුත් ස්වාධීන වෘත්තීය සමිති පිහිටුවීමට ඉඩ දිය යුතුය. එම සමිතිවල කාන්තා නායකත්වය තහවුරු කළ යුතුය.

**මේවා වරප්‍රසාද නොව අයිතිවාසිකම්ය.**

සෑම ඇඟළුමක්ම පසුපස ඇති කාන්තාවන්ගේ සිහින, බලාපොරොත්තු, දහඩිය සහ කඳුළුවලට වටිනාකමක් ලැබීම කාන්තා අප හඬ නැගූ විට සැබෑ වනු ඇත.

ඩාබිඳු අප මෙම කාන්තා දිනයේ දී අභියෝග හමුවේ නොසැලෙන අධිෂ්ඨානයෙන් පවුල තුළත් වැඩ පරිසරය තුළත් තම භූමිකාව ඉටුකරන සෑම කාන්තාවක්ම ගෞරවයෙන් සමරමු.

# රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන පාර්ශවකරුවන් අතර සාකච්ඡා



2026 පෙබරවාරි 25 වන දින වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී රාජ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන පාර්ශවකරුවන් සහ ඩාබිඳු සාමූහිකය අතර රැස්වීමක් සාර්ථකව පැවැත්විණි. මෙම රැස්වීම සඳහා ප්‍රදේශයේ සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය ආයතන සහ අනෙකුත් අදාළ අංශ නියෝජනය කරමින් සහභාගී වූවන් 25 දෙනෙකු සහභාගී විය. සාකච්ඡා කිරීමේ අරමුණින් මෙම රැස්වීම සංවිධානය කරන ලදී.

මෙම සාකච්ඡාවට ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ වව්නියාව දිස්ත්‍රික්කයේ ඇඟළුම් කම්හල් සහ නිදහස් වෙළඳ කලාපවල සේවය කරන කාන්තා සේවිකාවන් මුහුණ දෙන ගැටළු, සහ අභියෝග කෙරෙහි ය. එහිදී ඉස්මතු කරන ලද ප්‍රධාන කරුණු අතර සේවා කොන්දේසි, සමාජීය හා ආර්ථික දුෂ්කරතා, සෞඛ්‍ය ගැටළු සහ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම ඇතුළත් විය. තවද ඩිජිටල් හිරිහැර, සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිතා කිරීම, රැකියා අනාරක්ෂිත බව, දිගු වැඩ කරන වේලාවන් සහ පවුල් ජීවිතයට,

විශේෂයෙන් ළමා රැකවරණයට ඇති බලපෑම වැනි ගැටලු ද සහභාගිවන්නන් සාකච්ඡා කළහ. හානිකර නිෂ්පාදන භාවිතය සහ සේවා ස්ථානය ආශ්‍රිත සෞඛ්‍ය අවදානම් ද මතු විය.

කාන්තාවන්ට වඩා හොඳ අවස්ථා නිර්මාණය කිරීම සහ ඔවුන්ගේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම වෙනුවෙන් කුසලතා සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ රැස්වීමේදී අවධාරණය කරන ලදී. එසේම සේවා ස්ථාන තුළ කළමනාකරණය සමඟ වඩා හොඳ සන්නිවේදනයක් සහ වැඩිදියුණු කළ සේවා කොන්දේසි සඳහා ඇති අවශ්‍යතාවය ද එය ඉස්මතු කළ අතර අවසාන වශයෙන් සහභාගීවන්නන් රජය සහ සිවිල් සමාජය අතර සහයෝගීතාවය ශක්තිමත් කරන අතරම කාන්තා සේවිකාවන්ගේ ජීවනෝපායන් සහ සේවා කොන්දේසි වැඩිදියුණු කිරීම සඳහා ප්‍රායෝගික නිර්දේශ සහ අනාගත ක්‍රියාමාර්ග යෝජනා කළහ.

# කණ්ඩායම් මනෝ සමාජීය සහය අපෙන්



කටුනායක සහ බියගම ප්‍රදේශයේ පසුගිය දිට්වා සමයේ පීඩාවට පත් කාන්තාවන් සඳහා මානසික සුවතාව සහ මනෝ සමාජ යහපැවැත්ම උදෙසා වන කණ්ඩායම් උපදේශන සැසි මාලාවක් පවත්වනු ලැබීය. මෙහිදී තමන් සතුටින් සිටින්නේ කෙසේද, තමන්ගේ සතුට තමන් සොයාගන්නේ කෙසේද, හරවත්ව ජීවිතය ගත කරන ආකාරය පිළිබඳවද සාකච්ඡා විය. මෙහිදී 2026/02/15 කටුනායකත් 2026/03/01 සහ 2026/03/15 යන දිනයන්හීදී බියගම ද පැවැත්වීය. මෙහිදී සම්පත් දායකත්වය මනෝ උපදේශිකා ගංගා රත්නායක මහත්මිය විසින් ලබා දෙන ලදී.

# සැමට පෝෂ්‍යදායී ආහාර වේලක්





**පසුගිය** දිට්වා සමයේ පීඩාවට ලක් වූ වව්නියාව සහ බියගම ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිතව සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා 2026/03/01 සහ 2026/03/15 යන දිනයන්හි දී වව්නියා ප්‍රදේශයේද 2026/03/15 දින බියගම ප්‍රදේශයේද කෑම බෙදා දීමේ වැඩසටහනක් පවත්වන්නට විය. ඒ අනුව සේවක සේවිකාවන් 200කට අධික පිරිසක් වෙනුවෙන් ආහාර ලබා දීම සිදු කරනු ලැබීය. සැමට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ විය.

# නිදහස් වෙළඳ කලාප සේවකයින් සඳහා පශ්චාත්-ආපදා සහන සහාය

**මෑත** කාලීන සුළි කුණාටුවේ දරුණු බලපෑමෙන් පසුව, බොහෝ නිදහස් වෙළඳ කලාප සේවකයින් ඔවුන්ගේ නිවාසවලට හානි වීම, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අහිමි වීම සහ ඔවුන්ගේ ජීවනෝපායන්ට බාධා වීම ඇතුළු සැලකිය යුතු දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. මෙම හදිසි තත්වයට ප්‍රතිචාර වශයෙන්, අප වෙත මූලයාධාර සපයන ආයතනයන්හි නොමසුරු සහයෝගය ඇතිව අපි පුළුල් සහන බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළෙමු.

බලපෑමට ලක් වූ සේවකයින්ගේ ක්ෂණික අවශ්‍යතා සපුරාලීම සහ ඔවුන්ගේ සුවවීමේ ක්‍රියාවලියට සහාය වීම මෙම මුලපිරීමේ අරමුණ විය. බලපෑමට ලක් වූ පවුල් සඳහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වියළි සලාක මලු බෙදා දීම, සනීපාරක්ෂක සහ විෂබීජ නාශක කට්ටල, ඇඳ ඇතිරිලි, මුළුතැන්ගෙයි උපකරණ සහ පාසල් සැපයුම් බෙදා හැරීම ඇතුළත් විය.

ඊට අමතරව ආරක්ෂිත ජීවන තත්වයන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා බලපෑමට ලක් වූ සේවකයින්ට වෛද්‍ය ආධාර සහ නිවාස අලුත්වැඩියා ආධාර ලබා දෙන ලදී. ස්වයං රැකියාලාභීන්ට ඔවුන්ගේ ජීවනෝපායන් නැවත ආරම්භ කිරීමට සහ ශක්තිමත් කිරීමට විශේෂ සහාය ද ලබා දෙන ලදී.

මෙම මැදිහත්වීම බලපෑමට ලක් වූ නිදහස් වෙළඳ කලාප සේවකයින් 250 කට වැඩි පිරිසකට සහ ඔවුන්ගේ පවුල්වලට හදිසි සහන සහාය ලැබුණි. මෙකී සහන ප්‍රයත්නය අර්බුදකාරී කාලවලදී සේවකයින් සමඟ සහයෝගීතාවයෙන් සිටීමට සාමූහික කැපවීමක් පිළිබිඹු කරන අතරම අපගේ හවුල්කරුවන්ගේ සහයෝගය සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව තුළින්, ගෞරවයෙන් සහ ආරක්ෂාවෙන් ජීවිත නැවත ගොඩනැගීම සඳහා දායක වීමට අපි ඉලක්ක කරමු.



# මෙවර ඩාබිඳු සාමූහිකයේ කාන්තා දින සැමරුම








වර්තමානය වන විට කාන්තාවක් කියන්නේ එක තැනකට සීමා වූ අයෙක් නෙවෙයි. මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයෙහි තේමා පාඨය වූයේ සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සහ යුක්තිය වෙනුවෙන් ක්‍රියාත්මක වෙමු යන්නයි. කාන්තාව ශක්තිමත් කරන්න අවශ්‍යයි, ඇයව දිරිමත් කරන්න අවශ්‍යයි වැනි විවිධ ප්‍රකාශ වේ. නමුත් මේ ලෝකයේ වස්තූන් පහක් තියනවා මිනිස්සු මවිත කරවන සහ මිනිස්සු පුදුම කරවන ඒවායින් එකක් ලෙස විශ්වය හඳුන්වා දිය හැකි. විශ්වය කියන්නේ බොහෝ දෑ සැඟවුන හරි පුදුම සුන්දර තැනක්. අනිත් එක තමයි තාම ගවේෂණය කර අවසන් නොමැති ශක්තීන් බොහොමයක් පිරුණු, සැඟවුණු සෞන්දර්යාත්මක චමත්කාරයෙන් පිරි සාගර පත්ල. මේ ගැන කතා කරගෙන යනකොට පස් වෙනි වස්තුව තමයි ගැහණිය. තවමත් ලෝකේ කවුරුත් ගැහැණිය ගැන තේරුම් ගෙන නැත. එබැවින් කවුරුන් හෝ පැවසුවහොත් ගැහැණිය ශක්තිමත් නෑ, දිරිමත් නෑ වැනි වචන එය ගැටලුවකි. ලෝක ඉතිහාසයේ පරිණාමය පිළිබඳව සාකච්ඡා කළහොත් ගැහැණිය සහ පිරිමියා කියන මේ දෙපාර්ශවයට සංස්කෘතිය විසින් සම්ප්‍රදාය විසින් එහෙම නැත්තන් පරිණාමය විසින් පවරා තියන මූලික රාජකාරී කිහිපයක් අපිට හඳුනා ගත හැකිය. එම වර්ගීකරණයට අපි රුචි නොවුනත් පිරිමියාගේ මූලික භූමිකාව බවට පත්වූයේ දරුවන් බිහිකිරීමට උදව් කිරීම, ආරක්ෂාව සැපයීම සහ පවුලට ආහාර සැපයීම කියන භූමිකා තුන වේ. ඒ කාලයේ ගැහැණියගේ භූමිකාව වූ ආහාර සැකසීම, දරුවන් බිහි කිරීම සහ දරුවන් රැක බලා ගැනීම යනාදියයි. අද වන විටදී පිරිමියා තම සාම්ප්‍රදායික භූමිකාව රැකගෙන සිටිද්දී ගැහැණිය සාම්ප්‍රදායික බව බිඳ හෙලමින් පිරිමියාගේ භූමිකාව ආක්‍රමණය කරමින් ඉදිරියට යමින් සිටී. ආරක්ෂක භූමිකාව, ආහාර සැපයීම වැනි භූමිකාවන් ගැහැණිය ආක්‍රමණය කොට අවසන්ය. මෙවන් දිරිය ලියන් තවත් අභිප්‍රේරණය කරන්නට ඩාබිඳු අපි 2026/03/08 දින කාන්තා දිනය සමරනු ලැබීය. ඒ සඳහා ඩාබිඳු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති මෙන්ම සාමාජිකයින් ද සිවිල් සමාජ සංවිධාන කිහිපයක් Building and Wood Workers' International ආයතනයේ නිළධාරින් මෙන්ම බියගම ප්‍රදේශයේ අපගේ සාමාජිකාවන් සහ කටුනායක ප්‍රදේශයේ සාමාජිකාවන් එහිදී නියෝජනය විය. මෙහි දී ඩාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරි විසින් ආරම්භක කතාව සිදුකරනු ලැබීය. වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූ නීතීඥ ශෙලනී පළිහවඩන මහත්මිය විසින් C190 පිළිබඳව මෙන්ම මෙවර කාන්තා දිනයේ තේමාව වූ සියලු කාන්තාවන් සහ කාන්තා දරුවන් සඳහා අයිතිවාසිකම්, සමානාත්මතාව, බලගැන්වීම සඳහා අවශ්‍ය නීතිමය පැතිකඩ මෙන්ම අවශ්‍ය දැනුම බෙදා දීම ද මෙහි දී සිදුවිය. එමෙන්ම දිරිය ලියන් 80 දෙනෙක් සඳහා වියළි සළාක ලබා ගත හැකි වවුචර්පත් බෙදා දීම සහ නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන ගැබිණි කාන්තාවන්ට පෝෂණ මලු, ඇඳුම් පැළඳුම් මෙන්ම සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීමද එහි දී සිදුවිය.

එමෙන්ම කාන්තා දිනය පාදක කර ගනිමින් තරඟයක් අප විසින් පවත්වනු ලැබීය. එහි දී වැඩ ලෝකයේ ප්‍රචණ්ඩත්වය හා කාන්තා හිංසනය, වැඩ ඇරී වැඩට යන කාන්තාවන්ගේ ජීවිතයේ අසීරු බව, කාන්තාවක් වීම නිසා ලැබිය යුතු අයිතිවාසිකම්, නිවස තුළ දී කාන්තාවන් මුහුණ දෙන හිංසනය (ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය) යන මාතෘකා පිළිබඳව කවි, නිසඳැස්, ටික් ටොක් වීඩියෝ කාන්තා දිනයට සති කිහිපයකට පෙර සිටම එකතු කරගන්නා ලදී. අපේ කාන්තාවෝ හරි දක්ෂයි. ලියන්ට වේවා, ගයන්නට වේවා, රඟන්නට වේවා, ඔවුන් හරි දක්ෂයි. එම තරඟයේ ජයග්‍රාහකයින් ඇතුලු සියලු දෙනාට කාන්තා දිනය පදනම් කර ගනිමින් ත්‍යාග ප්‍රධානය ද එදින සිදුවිය.

කවීශා වන්නිනායක



# දිරිය ලියන්ට කාන්තා දිනය පදනම් කරගනිමින් අපෙන් අත්වැලක්






ජීව විද්‍යාත්මක සාධක අනුව කාන්තාව යනු මේ ලෝකය ජීවියෙක්. මැක්සිම් ගෝර්කි සදහන් කරන පරිදි මේ ලෝකය ලස්සන වෙන්නේ මවගේ කිරි වලිනුයි සූර්යයා ලෝකයෙන් යන බවයි. කාන්තාවක් නැත්තම් මනුෂ්‍ය සංහාරයටම පැවැත්මක් නැත. ඒ නිසා කාන්තාව කියන්නේ කුටුම්භය තුළ සහ රට තුළ ලෝකය තුළ අත්‍යවශම ජීවියායි. මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයෙහි තේමා පාඨය වූයේ සියලු කාන්තාවන් සහ ගැහැණු ළමයින් අයිතිවාසිකම් යුක්තිය වෙනුවෙන් ක්‍රියාත්මක වෙමු යන්නයි. ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිතව සේවය කරනු ලබන කටුනායක සහ බියගම ප්‍රදේශයේ ගැබිණි දිරිය මව්වරුන් දසදෙනෙකු වෙනුවෙන් ඇඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය, ආහාර සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් පෝෂණ මලු බෙදා හැරීම 2026/03/08 වන දින සහ 2026/03/15 යන දිනයන් හී දී ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලදී.

# දිරිමත්ව ඉදිරියට යන ගැහැණුන්ට පුංචි සවියක්



"ගැහැණිය ශක්තිමත් ද නැද්ද  කියලා බලන්න රිද්දලා බලන්න ඕනේ" කියලා කියමනක් ද ඇත. රිදුන තැනදී ගැහැණිය අලු ගසා දමා දිරිමත්ව ඉදිරියට යන්නට පටන් ගනී. සමහර පවුල් වල පවුලට අයින් කරන්න කඩා වැටෙන විට ආර්ථිකය වැටෙනවිට ප්‍රශ්න එනවිට පිරිමින්ගේ පලා යාම බහුල වශයෙන් දක්නට ලැබේ. නමුත් ගැහැණිය මව දරුවන් එක තුරුලට රැගෙන ආර්ථික ශක්තිය ද කර පින්නාගෙන දිරියෙන් ඉදිරියට ගමන් කරයි. පසුගිය සමයේ ගංවතුරෙන් මෙන්ම ආර්ථික අපහසුතාවයන්ට මුහුණු දුන් කටුනායක බියගම ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිතව සේවය කරනු ලබන කාන්තාවන් 80 කට රුපියල් 4000 බැගින් වූ මුදල් වවුචර්පත් බෙදා දීම 2026/03/08 වන දින සිදුවිය.



# ඇඟළුම් කම්හල් වසා දැමීම සාධාරණද?

දිගු ඉතිහාසයක් සහිත ප්‍රධාන පෙළේ සන්නාමයන් වෙනුවෙන් ඇඟළුම් නිෂ්පාදනය කරන ප්‍රමුඛ පෙළේ කර්මාන්තශාලා රැසක් ලංකාව තුළ පවතී. මේවායෙහි අවම වශයෙන් සේවකයින් 250ට අධික පිරිසක් සිය රැකියාව සිදු කරනු ලබයි. නමුත් වත්මනය වනවිට එහි පවතින්නේ නවතම රැල්ලකි. කටුනායක NEXT කර්මාන්තශාලාව වසා දැමීමත් සමඟ ලංකාවේ "ප්‍රමුඛ පෙළේ" යැයි හඳුන්වනු ලබන කර්මාන්තශාලා ගණනාවක් වසා දැමීමේ රතු එළි නිකුත් තර ඇත්තේ සේවකයින් දස දහසකගේ අනාගතය, බලාපොරොත්තු දෙදරා යන තැනකදී ය.

බොහෝ සේවකයින් රැකියා අවස්ථා සොයා ග්‍රාමීය දිස්ත්‍රික්කවලින් සංක්‍රමණික වූ කාන්තාවන් වේ. අභ්‍යන්තර සංක්‍රමණික නිදහස් වෙළඳ කලාප සේවකයින්ට මෙම බලපෑම විශේෂයෙන් බරපතල වන්නේ ඔවුන් තම ගම්මානවලින් ඈත්ව ජීවත් වන බැවිනි. නිදහස් වෙළඳ කලාපවල බොහෝ සේවකයින් ආහාර, නිවාස කුලී ප්‍රවාහනය සහ දෛනික පැවැත්ම ද මාසික වැටුප් මත සම්පූර්ණයෙන්ම රඳා පවතී. කර්මාන්තශාලා හදිසියේම වැසෙන විට, සේවකයින්ට වහාම ඔවුන්ගේ ආදායම, නවාතැන් ආරක්ෂාව සහ ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමේ හැකියාව අහිමි වේ. බොහෝ සේවකයින්ට ණය, නවාතැන් වියදම්, දරුවන්ගේ අධ්‍යාපන වියදම් සහ දෙමාපියන් හෝ සහෝදර සහෝදරියන් නඩත්තු කිරීමේ වගකීම් ඇත. හදිසි විරැකියාව ඔවුන් දැඩි මූල්‍ය දුෂ්කරතාවන්ට තල්ලු කරයි. කටුනායක සහ බියගම නිදහස් වෙළඳ කලාපවල බොහෝ සේවකයින් දැනටමත් නිසි ශ්‍රම ආරක්ෂණ ක්‍රමවේද හෝ ප්‍රතිපත්ති නොමැතිව අනාරක්ෂිත මිනිස් බල විධිවිධාන යටතේ සේවය කරති. කර්මාන්තශාලා වැසෙන විට, මෙම සේවකයින්ට බොහෝ විට නිසි වන්දි, විකල්ප රැකියා හෝ සමාජ ආරක්ෂාව නොලැබේ. කර්මාන්තශාලාවල දශක ගණනාවක් ගත කළ විශේෂයෙන් අවුරුදු 40 ට වැඩි සේවකයින් වයස හේතුවෙන් නව රැකියා සොයා ගැනීමට අරගල කරයි.

උතුරේ කර්මාන්තශාලා සේවකයින් සඳහා වන බලපෑම ඊටත් වඩා දරුණු විය හැකිය, මන්ද පශ්චාත් යුධ ප්‍රදේශවල රැකියා අවස්ථා දැනටත් සීමිතය. යුද්ධයෙන් පසු විකල්ප ජීවනෝපායන් නොමැතිකම හේතුවෙන් උතුරේ කර්මාන්තශාලාවල බොහෝ කාන්තාවන් ඇඟළුම් සේවකයින් බවට පත්විය. කර්මාන්තශාලා වැසීම නිසා මේ වන විටත් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්හි දරිද්‍රතාවය, සංක්‍රමණ පීඩනය සහ ආර්ථික අනාරක්ෂිතභාවය වැඩි වේ. උතුරේ කර්මාන්තශාලාවල රැකියා අහිමිවීම දේශීය ආර්ථිකයන්ට ද බලපායි, මන්ද කම්කරුවන්ගේ වැටුප් එම ප්‍රදේශවල සමස්ත පවුල් සහ කුඩා ව්‍යාපාර සඳහා සහාය වේ.

එබැවින් කර්මාන්තශාලා වැසීම තනි සේවකයින්ට පමණක් බලපාන්නේ නැත. ඒවා පවුල්, ප්‍රජාවන්, ළමා අධ්‍යාපනය, කාන්තා ආරක්ෂාව සහ ශ්‍රී ලංකාවේ කම්කරු පන්ති ප්‍රජාවන්ගේ සමස්ත සමාජ හා ආර්ථික ස්ථාවරත්වයට බලපායි. අසාධාරණ ලෙස කර්මාන්තශාලා වැසීමෙන්, සේවකයින් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ශ්‍රම ආරක්ෂණ, නිසි වන්දි, පූර්ව දැනුම්දීම, සමාජ ආරක්ෂාව සහ රජයේ මැදිහත්වීම කම්කරුවන් සහ කම්කරු සංවිධාන දිගටම ඉල්ලා සිටී. ඒ අනුව කම්කරු නීතියට අනුව කටයුතු කිරීමට පාලකයින් වග බලා ගත යුතු වනවා මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව ද කම්කරුවන්ට සාධාරණය ඉටු කිරීමට වග විය යුතු බව නැවත නැවතත් මතක් කර දෙයි.

# වැඩ කරන කාන්තාවන් සඳහා සමාජ ආරක්ෂාව සහ යුක්තිය සහතික කිරීම

සෑම වසරකම පෙබරවාරි 20 දිනට යෙදෙන ලෝක සමාජ යුක්තියේ සහ සාධාරණත්වයේ දිනය මෙවරත් සිහිකර දුන්නේ සියලුම දෙනාට සාධාරණත්වය සමානාත්මතාවය සහ ගෞරවය ලැබීමේ වැදගත්කමයි.

එක්සත් ජාතීන් විසින් මෙම දිනය ආරම්භ කිරීමේ අරමුණ වූයේ දුප්පත්කම, විරැකියාව, ලිංගික දිශානතිය මත සමාජයෙන් වෙන් කිරීම වැනි ගැටලු විසඳීමට කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීමටයි. ඇඟළුම් කම්කරු සේවිකාවන් සමඟ සමීපව කටයුතු කරන සංවිධානයක් ලෙස ඩාබිඳු අප මෙම සමාජ යුක්තියේ දිනය දකින්නේ
ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ඇඟළුම් කම්කරු සේවිකාවන් මුහුණ දෙන දෛනික යථාර්ථයන් පිළිබඳ සිතා බැලීමට අවස්ථාවක් ලෙසයි.


ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සිට පැමිණ නිදහස් වෙළඳ කලාපවල තාවකාලික පදිංචිකරුවන් ලෙස ජීවත් වන සියලු සේවකයන්ගේ අරමුණ තම මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් සපයා ගැනීමටයි. ඔවුන්ගේ දායකත්වය රටේ ආර්ථික ස්ථාවරය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය දෙයක් වුවත් බොහෝ කාන්තාවන් අඩු වැටුප්, රැකියා සුරක්ෂිතතාවය අඩුවීම, සමාජ ආරක්ෂණය නැතිවීම සහ විවිධාකාරයේ හිංසන වැනි තවත් බොහෝ අභියෝගවලට මුහුණ දෙති. එපමණක් නොව ඔවුන්ට තම රැකියාවත් තමන්ට දුරින් සිටින තම පවුල් සබඳතා පවත්වා ගැනීම මෙන්ම සමාජ දුර්මත වලට මුහුණ දීමටත් සිදුව ඇත.

නමුත් සමාජ යුක්තිය යනු සියලු සේවකයන්ට නිසි ගෞරවය ලැබීම සාධාරණ සේවා පරිසරයක් ලැබීම සහ අයිතිවාසිකම් හිමිවීමයි. එමෙන්ම කාන්තාවන් යනු කම්කරුවන් හෝ සුරැකුම් වැඩ කරන්නියන් පමණක් නොව ඔවුන්ගේ හඬ, අපේක්ෂා සහ තම ජීවිතය හැඩගස්වා ගැනීමේ අයිතිය තමන්ට හිමි අය ලෙස පිළිගත යුතුයි.

සමාජ යුක්තිය ස්ථාපිත කිරීම අප සැමගේ වගකීමක් බවත් ඒ සඳහා රජය, සිවිල් සමාජ සංවිධාන, මෙන්ම ප්‍රජාව සියලු දෙනාම එක්සත් විය යුතු බව මතක් කළ යුතුය.

**කාන්තාවෙනි - ඔබේ දක්ෂතාවය සහ ඔබේ හඬ තුළින් සමාජ යුක්තිය සහිත සාධාරණ සමාජයක් ළඟා කරගත හැක. ඒ සඳහා පෙළගැසෙන්න.**

**රුවිනි සකුන්තලා**



# සිතුවිල්ල

අපේ දිනේ සමරන්නට 8 වෙනිදා උදෙන්ම ඇවරිවත්ත ඔරලෝසු කණුව ළඟට ගියා. හිතට මාර ගතියක් දැණුනා. අපි ගැන හඬ නගනවා මාත් ගිරිය පලාගෙන කවි කොළේ කියන්න දායක වුනා. ගැම්මට කිව්ව කවිය තවමත් මතකයි.

"අපි කන හැටි - ලිපා දනී
දරු පවුලම - කන්නේ ගිනී
උන්ට මනී - අපිට ගීනි
විකල්පයක් - අපට නැතී"

මීට වඩා අපි තව මොනා කියන්නද? ඒත් පාලකයාට කවද්ද අපි ගැන දැනුනේ. මං නම් වැඩ කරද්දි මට බනින උන්ට හිතින් මවාගෙනම හිතේ දුක නිවා ගත්තා. වැඩපළ තුළ අපිට කෝ ඉඩක් මැෂිම උඩ මැරිලා වැටුනත් බලන්න කෙනෙක් නෑ. වෘත්තීය සමිති, සේවක සභා HR කිව්වට කවුද? කොහෙද අපේ ගැටළු ආමන්ත්‍රණය කළේ. පාරේ කෑගහද්දී බයකුත් දැනුනා වැඩපළට කේළමක් කියලා ජොබ් එකට කෙළවෙයිද කියලා. ඒත් අපේ දිනේට අපි පාරට එන්නේ නැතුව කවුරු එන්නද. එදා දේශණයේ දී ත් කිව්වා පැය 16ක වැඩ කාලයක් අඩු කරගන්න. එදා කතා ටිකනම් මරු කුස්සියේ වැඩ බෙදා ගැනීම ගැන දැනුවත් කළා. ගෙදර වැඩ ගැහැණුන්ට පැටවිලා තියෙන එකත්... ගෙදර වැඩ නැවැත්තුවොත් මොකද වෙන්නේ කියලා සම්පත්දායකතුමිය අහද්දී මට එකපාරටම මතක් වුනේ අපේ ගෙදර අම්මා කොයි තරම් නැහෙනවද. නැගිටින්නෙම කේතලේ රත්කරගෙන. පිරිමි 3ක් හිටියට කවදාවත් ඒ අත්වලින් උයපු කෑමක් අපි කාලා තියෙනවාද. ඒවා අපට හීන. ඒ කියපු දත්ත එක්ක මට අම්මා ගැන දුක හිතුනා. මොන සුමයක්ද කරන්නේ කියලා. ඇත්ත තමයි මේවටනම් ප්‍රතිපත්ති හදන්න ඕනා. පුළු පුළුවන් විදියට ඩාබිඳු අපිට සලකනවා. එදා තෑගි වවුචරුත් ලැබුනා. අපි ගැන හඬ නගන්න හැමදාම අපිට හිටියේ එයාලා. මේ පළාතේ කවුද අපි ගැන බැලුවේ. අපිට දෙයක් දුන්නේ එදා අපි අතහිත පුරෝගෙන සතුටින් විසිරුණා.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 55

| | | | | |
|---|---|---|---|---|
| 1 මි | | 2 | | ■ |
| | ■ | | ■ | 3 දි |
| 4 | රු | ■ | 5 | |
| | ■ | 6 | ■ | |
| 7 | | | ප | |

## හරහට

1. පැන්සල් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඛණිජ වර්ගයකි.
4. ඉන්දියාවේ හිටපු අගමැතිවරයෙකි.
5. ගණිතයේ බිංදුවෙන් පහළ සෑම අගයක්ම මෙම කාණ්ඩයට අයත් වේ.
7. විශාල වගාවක් යටින් කෙරෙන වගාව මේ නමින් හඳුන්වයි.

## පහළට

1. ගොවි ජනපදවලින් එකකි.
2. කෙසෙල්වලට තවත් නමකි.
3. හිරු.
6. රෝමය ගිනි ගනිද්දි වීණා වැයුවා යයි කියන්නේ මොහුය.

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා පහත සඳහන් ලිපිනයට ඒවා මුදලින් රු.1000 ක් වටිනා තෑගි දිනාගන්න.**

**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**
**දුරකථන අංකය: 077 725 9892**

# කාන්තාව

කර තබන කුසලානයේ
රන්වන් මුදු
කරලියට ගෙනැලුමේ
සුවදැති මල් පෙද
රැක බලා සිටින ගෙපිල්
සුපුන් සෙද
සිරි ලොවට නංවන
කාන්තාව නිසද...

කර්මාන්ත ශාලාවේ
යන්ත්‍ර සුසැද
රෝහල් පිල් වල සුව
කරන හිත සද
ගුරු කීමේ පන්ති
කාමරේ හොඳ
සියළු තැනම හෙබි
කාන්තාව ලක්ෂණැද...

වියෝ වැඩෙහි යෙදෙන
අත් දෙක නිසද
සිහින ගොඩ නංවන මන
දොළ පුරද
සමාජයේ තරුවක්
සැමටම පෙමද
ගැහැනියගේ බලය
ලොවපුරා පැතිරේද...

එ.එම්. ශම්මි ශෂිරංගි
බියගම නිදහස් වෙළඳ කලාපය



# කම්කරු නීති ප්‍රතිසංස්කරණයට පෙර කම්කරුවන් සමඟ සාකච්ඡා කළ යුතුයි

කම්කරු නීති ප්‍රතිසංස්කරණය පිළිබඳව මේ දිනවල විවිධ මට්ටම්වල සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. එහෙත්, මෙම නීති වෙනස්කම් සම්බන්ධයෙන් වඩාත් වැදගත් පාර්ශවය වන කම්කරුවන්ගේ අදහස් සහ යෝජනා ප්‍රමාණවත් ලෙස ඇතුළත් විය යුතු බව කම්කරු හා සමාජ ක්‍රියාකාරීන් පෙන්වා දෙයි.

විශේෂයෙන්ම නිදහස් වෙළඳ කලාප සේවිකාවන්, කර්මාන්තශාලා කම්කරුවන්, ධීවර කාන්තාවන් සහ අවිධිමත් අංශයේ සේවකයින් මුහුණ දෙන ගැටළු සැලකිල්ලට නොගෙන සිදුකරන නීති සංශෝධන ප්‍රායෝගික වශයෙන් අසාධාරණ තත්ත්වයන්ට හේතු විය හැකි බව ඔවුන් අවධාරණය කරයි.

සේවා කාලය, වැටුප්, රැකියා සුරක්ෂිතභාවය, මාතෘ ප්‍රතිලාභ, සමාජ ආරක්ෂණය සහ සේවා ස්ථාන හිංසනයෙන් ආරක්ෂාව වැනි කරුණු කම්කරු නීති තුළ ප්‍රමුඛ අවධානයක් ලැබිය යුතු බව ද ඔවුන් සඳහන් කරයි. විශේෂයෙන් ILO C190 සම්මුතියට අනුකූලව සේවා ස්ථාන හිංසනය හා හිංසාකාරී හැසිරීම් වැළැක්වීම සඳහා නීතිමය ආරක්ෂාව ශක්තිමත් කළ යුතු බවත් අවධාරණය කෙරේ.

කම්කරුවන්ගේ ජීවිත හා අනාගතය සෘජුවම බලපාන නීති සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී, කම්කරුවන්ගේ හඬට ප්‍රමුඛතාව ලබාදීම අත්‍යවශ්‍ය වේ. එබැවින් කම්කරු නීති ප්‍රතිසංස්කරණය සම්බන්ධ සාකච්ඡාවලට කම්කරුවන්, වෘත්තීය සමිති සහ කාන්තා සංවිධාන සක්‍රියව සම්බන්ධ කරගැනීම කාලීන අවශ්‍යතාවයක් බව සමාජ ක්‍රියාකාරීන් පෙන්වා දෙයි.



# කාන්තාවන් රාත්‍රී සේවයෙහි යෙදවීම

රාත්‍රී සේවය යන්නෙන් අදහස් කරන්නේ, ප.ව. 10.00 සිට පෙ.ව. 5.00 අතරතුර අනුක්‍රමයෙන් එළඹෙන පැය 11 ක කාලයයි. වයස අවුරුදු 18ට වැඩි අය පමණක් රාත්‍රී සේවයේ යෙදවිය හැක.

**ස්ත්‍රීන් රාත්‍රී සේවයේ යෙදවිය හැකිද?**

ඔව්, එහෙත් සේවයේ යෙදවීමට කලින් සේවා යෝජකයා විසින් කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයක් ලබා ගත යුතුය. එම අවසරය ලබා ගැනීමට ප්‍රථම සේවායෝජකයා කොන්දේසි කිහිපයක් සපුරාලීම අවශ්‍යය.

එම කොන්දේසි වලට අනුව සිය කැමැත්තට විරුද්ධව (බලෙන්) කිසිඳු ස්ත්‍රියකට රාත්‍රී කාලයෙහි සේවය කිරීමට බල නොකළ යුතුය.

**දහවල් සේවයේ යෙදුන අයම රාත්‍රී සේවයේ යෙදවිය හැකිද?**

යම් දිනක පෙ.ව. 6.00 සහ ප.ව. 6.00 අතර කාලය තුළ සේවයෙහි යොදවන ලද කිසිම ස්ත්‍රියක් එදිනම ප.ව. 10.00 න් පසු සේවයෙහි නොයෙදවිය යුතුයි.

**රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන අයට ගෙවන්නේ කොහොමද?**

රාත්‍රී කාලයේ දී වැඩ කරන සෑම ස්ත්‍රියක් විසින්ම ඇය විසින් ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එකහමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතුය. එම මුදල සඳහාද සේවක අර්ථසාධක අරමුදල දායක මුදල් ගෙවිය යුතුය.

රාත්‍රී කාලයේ වැඩ කරන සේවිකාවන් සඳහා සේවා යෝජක විසින් විවේක කාමර හා කෑම බීම සපයනු ලැබිය යුතුය.

රාත්‍රී කාලයේ දී වැඩකරන කාන්තාවන්ගේ සුභ සාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත්කළ යුතුය.

එක් මාසයක් තුළ දී කිසිම ස්ත්‍රියක් දින 10කට වැඩියෙන් රාත්‍රී සේවයේ නොයෙදවිය යුතුය.

කාන්තාව රාත්‍රී සේවයේ යෙදෙන අතරතුර කාලයේ සේවා මුරය අවසන් කළ නොහැක.රාත්‍රිය මුළුල්ලේම වැඩ කිරීමට ඒ අයට අවසර දිය යුතුය.

**මෙම කොන්දේසි රාත්‍රී සේවයේ යෙදෙන සෑම ස්ත්‍රියකටම බලපානවාද?**

මෙම කොන්දේසි බලපාන්නේ කාර්මික ව්‍යාපාරයක සේවයේ යොදවනු ලබන ස්ත්‍රීන්ට පමණයි.

කළමනාකරණ හෝ ශිල්පීය ස්වභාවයේ වගකිව යුතු තනතුරු දරණ ස්ත්‍රීන්ටත්, සාමාන්‍යයෙන් කය වෙහෙසා කෙරෙන වැඩවල නොයෙදෙන සෞඛ්‍ය හා සුභසාධන සේවා වල නියුක්ත ස්ත්‍රීන්ටත්, එකම පවුලේ සාමාජිකයින් පමණක් සේවයේ නියුක්ත කාර්මික ව්‍යාපාරයක ස්ත්‍රීන්ටත් මේ කොන්දේසි බලපාන්නේ නැත.

සාප්පුවක හෝ කාර්යාලයක සේවය කරන කාන්තාවන් රාත්‍රී 8.00 දක්වා පමණක් සේවයේ යෙදවිය හැක.

හෝටලයක හෝ භෝජනාගාරයක කාන්තා සේවිකාවන් රාත්‍රී 10.00 දක්වා සේවයේ යෙදවිය හැක.

**රාත්‍රී සේවා කොන්දේසි කඩ කරන සේවා යෝජකයින්ට විරුද්ධව කටයුතු කළ හැකිද?**

ඔව්, කටයුතු කළ හැකියි. මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීමෙන් අනතුරුව රු. 10,000/-කට නොවැඩි දඩයකට හෝ අවුරුදු 1කට නොවැඩි සිර දඬුවමකට හෝ දඩය සහ සිර දඬුවම යන දඬුවම් දෙකටම යටත් කළ හැකිය.

**තවදුරටත් මේ පිළිබඳ තොරතුරු දැන ගැනීමට අවශ්‍යනම් ළඟම තිබෙන කම්කරු කාර්යාලයෙන් හෝ 011 - 2587315, 011 - 2369297, 011 - 2368539, 011 - 2369800 අමතා තොරතුරු විමසන්න.**

උපුටා ගැනීම - කාන්තා හා ළමා කටයුතු අංශය,
කම්කරු දෙපාර්තුමේන්තුව

අංක: 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.